## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

# ලංසු ආරාධනයයි

### රත්මලාන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය පිරිමි නේවාසිකාගාරය සඳහා යෝජිත ගොඩනැගිල්ල සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ කටයුතු

**කොන්ත්‍රාත් අංකය : MOD/KDU/04/2021**

01. රත්මලාන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය උප කුලපති වෙනුවෙන්, ආරක්ෂක අමාත්‍යාංශයීය ප්‍රසම්පාදන කමිටුවේ ටෙන්ඩර මණ්ඩල සභාපතිවරයා විසින් ඉහත දක්වා ඇති කටයුතු සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් (ශ්‍රී ලංකාව තුළ පමණක්) මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

02. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2022/02/14 සිට 2022/03/15 දක්වා** වැඩ කරන දිනවල පැය 0900 සිට 1500 අතර කාලයේදී නැවත ගෙවනු නොලබන රු. 50,000.00 ක ගාස්තුවක් ගෙවා **ප්‍රධාන මූල්‍ය නිළධාරී (i), ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අංක. 15/5, බාලදක්ෂ මාවත කොළඹ 03, ශ්‍රී ලංකාව**, වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය ලබා ගත හැකිය. ගෙවීමේ ක්‍රමය මුදල් මගින් පමණි.

03. යෝග්‍ය ලංසුකරුවන් පහත ප්‍රධාන සුදුසුකම් නිර්ණායකවලට අනුකූල විය යුතු ය.

අ. තෝරනු ලබන කොන්ත්‍රාත්කරුවාගේ ICTAD (CIDA) ලියාපදිංචිය පහත පරිදි විය යුතුය.

| විශේෂඥතාව | ශ්‍රේණිය |
|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම | C1 හෝ C2 |
| පදනම් සැලසුම (අදාළ වන්නේ නම් පමණක්) | GP-B3 හෝ ඉහළ |
| ගොඩනැගිලි සේවා (විදුලි, MVAC, ගිනි ආරක්ෂණ සහ හඳුනාගැනීමේ පද්ධති, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති යනාදිය) | විදුලි පද්ධති සඳහා EM 3 හෝ ඉහළ සහ අනෙක් ඒවා සඳහා EM 4 හෝ ඉහළ |

ආ. පසුගිය වසර පහ තුළ සිදු කළ සාමාන්‍ය වාර්ෂික ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් මිලියන 460 හෝ ඊට වැඩි අගයකින් යුක්ත විය යුතුය.

ඇ. අනෙක් කොන්ත්‍රාත්තුමය බැඳීම් සහ කොන්ත්‍රාත්තුව යටතේ කෙරෙන අත්තිකාරම් හැර අවම ද්‍රවශීලතා වත්කම් සහ/හෝ ණය පහසුකම්වල අගය ශ්‍රී ලංකා රුපියල් මිලියන 100 ට නොඅඩු විය යුතු ය.

ඈ. ගොඩනැගිලි සැලසුම් කටයුතු සහ ගොඩනැගිලි ඉදිකිරීම්, ගොඩනැගිලි සේවා සහ විදුලි ස්ථාපනයන්, ගිනි හඳුනාගැනීම් සහ ආරක්ෂණය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ජාල හා ජලනල සහ ජලාපවහන කටයුතු යනාදියට සමාන සංකීර්ණතාවකින් යුතු සැලසුම් කිරීම් සහ ඉදිකිරීම් සම්බන්ධව කොන්ත්‍රාත්කරුවෙකු ලෙස පළපුරුද්ද ලබා තිබිය යුතු ය. පසුගිය වසර 10 තුළ අවම වශයෙන් ලංසුකරුවාගේ විශේෂඥතාව යටතේ එක් හෝ ව්‍යාපෘතියක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

ඉ. යෝග්‍ය ලංසුකරුවා අසාධු ලේඛනගත වී නොසිටිය යුතු ය.

04. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා, අධ්‍යක්ෂක, (කාර්යය සම්පාදන), ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (දුරකථන : 071-0219384, 011-2632430. ෆැක්ස් : 011-2632430. විද්‍යුත් තැපෑල - directorlogistics@kdu.ac.lk)

05. සතියේ වැඩකරන දිනයන්හිදී **2022/02/14** සිට **2021/03/15** දක්වා පැය 0900 සිට පැය 1500 අතර කාලය තුළ ප්‍රධාන මූල්‍ය නිලධාරී (1) කාර්යාලය, 2 වන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ශ්‍රී ලංකාව යන ලිපිනයේදී ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය. (දුරකථනය 011-2390719 ෆැක්ස් 011-2390720 සහ විද්‍යුත් ලිපිනය procurement@defence.lk)

06. **2022/02/28** දින පැය 1000 ට පූර්ව ලංසු රැස්වීමක් රත්මලාන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී පැවැත්වෙනු ඇත. රැස්වීමෙන් අනතුරුව ක්ෂේත්‍ර චාරිකාවක් සැලසුම් කෙරෙනු ඇත.

07. **2022/03/16** සිට **2022/07/13** දක්වා ලංසුව වලංගු විය යුතුය (ලංසු භාරදීමේ අවසන් දිනයේ සිට දින 119).

08. සියලුම ලංසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත බැංකුවකින් **2022/03/16** දින සිට 2022/08/10 දක්වා (ලංසු විවෘත කිරීමේ දින සිට ලිත් දින 147ක්) වලංගු වෙන පරිදි නියමයක් රහිත ඉල්ලුම මත ඇපකරයක් ආකාරයෙන් ලබාගත් **රුපියල් 3,300,000.00** "ලංසු ආරක්ෂණයක්" සමග ඉදිරිපත් කළ යුතු ය. ලංසු ආරක්ෂණයේ ප්‍රාතිලාභියා විය යුත්තේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ය.

09. **මුද්‍රා තබන ලද** ලංසු, මුල් පිටපත සහ අනුපිටපත සමග ප්‍රධාන මූල්‍ය නිලධාරී (1) කාර්යාලය, 2 වන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ශ්‍රී ලංකාව යන ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

| ලියුම් කවරය | අවශ්‍යතාව |
|---|---|
| ලියුම් කවරය 1 සහ ලියුම් කවරය 3 | 1 මුල් පිටපතක් සහ අනුපිටපත් 2ක් |
| ලියුම් කවරය 2 | 1 මුල් පිටපතක් සහ අනුපිටපත් 2ක් (වාස්තු විද්‍යාත්මක සැලසුම්වල වර්ණ පිටපත් සමග විද්‍යුත් පිටපත් සහ දෘඪ පිටපත් යන දෙකෙන්ම) * |

*ඉදිරිපත් කරනු ලබන සියලුම විද්‍යුත් පිටපත්වල ක්‍රියාකාරීත්වය ලංසුකරුවා තහවුරු කළ යුතු ය.

10. ඉදිකිරීම් කාලය **ලිත් දින 250** කි.

11. සම්පූර්ණකරන ලද ලංසු **2022.03.16** දින පැය 14.30ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලකිය යුතුවන අතර නැතහොත් එම ලිපිනයේ තබා ඇති ලංසු බහාළුමේ තැන්පත් කිරීමට කටයුතු කළ යුතු වේ.

ප්‍රධාන මූල්‍ය නිලධාරී (1) කාර්යාලය,
2 වන මහල,
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ශ්‍රී ලංකාව.

ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප වනු ඇත. ලංසු භාර ගැනීමේ කාලය අවසන් වූ විගස, සහභාගී වීමට කැමති ලංසු කරුවන් ඉදිරිපිට, ලැබී ඇති ලංසු (කවර1 සහ 2) විවෘත කරනු ලැබේ.

12. ලංසුව බාරදීමට පෙර, 1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි සහතික ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.

13. ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

14. ලංසු විවෘත කිරීමට සහභාගී වන අයගේ නම සහ ජාතික හැඳුනුම් පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය, ප්‍රධාන මූල්‍ය නිලධාරී (1), ආරක්ෂක අමාත්‍යාංශය වෙත, ලංසු විවෘත කිරීමට අවම වශයෙන් දින 03කට පෙර, ලිඛිතව දැනුම් දිය යුතු බව ලංසුකරුවන් හට මෙයින් දැනුම් දෙනු ලැබේ. තවද මෙම සම්පාදනය සම්බන්ධව යම් යම් රාජකාරි කටයුතු සඳහා සහභාගී විය යුතු අයගේද නම සහ ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය ප්‍රධාන මූල්‍ය නිලධාරී (1), ආරක්ෂක අමාත්‍යාංශය වෙත දැනුම්දී තිබිය යුතු වේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**
**ශ්‍රී ලංකාව.**